නාරා/පාලන/2025/65/RL/ටෙන්ඩර් අංක32 2025.11.25

අධ්‍යක්ෂ පාලන

.................................................................

.................................................................

මහත්මයාණනි/මහත්මියනි,

<u>ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනයේ (නාරා-නිට්ටඹුව ) ප්‍රවාහන සේවා ලබා ගැනීම සඳහා ලංසු කැඳවීම-2026</u>

ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනය (නාරා) ධීවර අමාත්‍යාංශය යටතේ පවතින පර්යේෂණ ආයතනයක් වේ.

කොළඹ-15 පිහිටි අප ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ නිට්ටඹුව කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන සේවා ලබා ගැනීමේ ලංසු කැඳවීමේ දැන්වීම, ඔබ ආයතනයේ වෙබ් අඩවියෙ හි පළ කිරීමට අවශ්‍ය කටයුතු සළසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

අදාළ දැන්වීම මේ සමග අමුණා ඇත.

මේ සම්බන්ධයෙන් ඔබ ආයතනය දක්වන සහයෝගය ඉතා අගය කරමි.

ආර්.ඩී.පී.පී රණසිංහ
අධ්‍යක්ෂක පාලන

පිටපත-ප්‍රධාන ලිපිගොනුවට

**ලංසු නිවේදනය**

**යොමුව-නාරා/පාලන/2025/65/RL/ටෙන්ඩර් අංක32**

**ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය**

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15**

## නාරා-නිට්ටඹුව ප්‍රවාහන සේවා ලබා ගැනීම සඳහා ලංසු කැඳවීම - 2026.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ (නාරා)කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලය විසින් මාසිකව ගෙවීමේ පදනම මත නාරා-නිට්ටඹුව ප්‍රවාහන සේවාව සඳහා කුළී වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරන ලෙසට මෙයින් ආරාධනා කරමි.

01. අදාළ වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය ලබා ගත හැක්කේ ආපසු නොගෙවන රු:1,000.00 ක මුදලක් අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින්,නාරා සරප් වෙත ගෙවීමෙන් පසුව මිලදී ගැනුම් හා සැපයුම් ඒකකය වෙතිනි. සේවා කොන්ත්‍රාත් කාලය එක් වසරක් වේ.

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගයක දුර කි.මී | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | අවශ්‍ය ආසන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| නිට්ටඹුව - නාරා | නිට්ටඹුව බස් නැවතුම අසල සිට නුවර පාර,මිරිස්වත්ත හන්දිය ,නුවර පාර ඔස්සේ කඩවත , කිරිබත්ගොඩ , කැළණිය , පැලියගොඩ,කොටලන, අළුත්මාවත හරහා නාරා ප්‍රධාන කාර්යාලය සහ ආපසු එම මාර්ගයේම නිට්ටඹුව බස් නැවතුම දක්වා. | කි.මී 38 | පෙ.ව 06.40 ට නිට්ටඹුව බස් නැවතුම අසල සිට | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටක්කුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 48 |

02. ලංසුවෙ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට දින 90 ක් එනම් , 2026.03.08 තෙක් විය යුතුය.

03. ලංසුව ඉදිරිපත් කිරීමේදී පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් හෝ අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින් නාරා සරප් වෙත මුදල් ගෙවා එහි මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.ලංසු සුරක්ෂණයේ වලංගු කාලය දින 119 ක් ,එනම් 2026.04.06 දක්වා වේ.

04. ලංසුව ඉදිරිපත් කිරීමේදී ආකෘතියේ කපා හෝ මකා හෝ වෙනයම් ආකාරයකින් හෝ වෙනසක් සිදු කරන්නේ නම් එම ස්ථානයන් හි ස්වකීය කෙටි අත්සන හා මුද්‍රාව යොදා එම වෙනස් කිරීම සහතික කළ යුතු අතර,එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසු ලේඛණ නිකුත් කරනු ලබන්නේ 2025.11.25 සිට 2025.12.08 වන දින දක්වා පමණි.මේ සම්බන්ධ පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2025.12.03 දින පෙ.ව 10.00 ට නාරා ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

06. මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2025.12.09 වන දින ප.ව 01.00 ට පෙර ''සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂන සහ සංවර්ධන නියෝජිතායතනාතනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15 යන ලිපිනයට ,ලියාපදිංචි තැපැලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-01 ට බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.

ලංසු බහාලන කවරය මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර,එම කවරයේ වම්පස ඉහළ කෙළවර "නාරා -නිට්ටඹුව කාර්ය මණ්ඩළ ප්‍රවාහන සේවා සඳහා මිළ ගණන් කැඳවීම-2026/ටෙන්ඩර් පෙට්ටි අංක- 01" යනුවෙන් සඳහන් කළ යුතුය.

07. 2025.12.09 දින ප.ව 01.00 ට ඉදිරිපත් වී ඇති ලංසු එදින එම වේලාවට ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනයේ (නාරා) මුදල් අංශයේදී විවෘත කරනු ලබන අතර ,එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකුට සහභාගි විය හැකිය.

08. මෙ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ,(අවශ්‍ය කෙරෙන වාහන වල විස්තර ,ගමන් මාර්ග හා අනෙකුත් පිරිවිතරයන්) **www.nara.ac.lk** නාරා වෙබ් අඩවිය මගින් හා 0112-521000/0112-529717,මිලදී ගැනුම් හා සැපයුම් නිළධාරි/නාරා මගින් ලබා ගත හැකිය.

ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය
කොළඹ-15
0112-529717/0112-521000

දිනය-2025.11.25

ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

# ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය(නාරා)

ලංසු අංකය-නාරා/පාලන/2025/65/RL/ටෙන්ඩර් අංක32

# නාරා කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සඳහා කුලී වාහන ලබා ගැනීමට ලංසු කැඳවීම.

(නාරා-නිට්ටඹුව ප්‍රවාහන සේවාව)

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත,මට්ටක්කුලියකොළඹ-15
0112-521 000/0112-529 717
2025.11.25

# පටුන


**01.** ලංසු ආරාධනා දැන්වීම පිටු අංකය - 03-04

**02.** ලංසු කැඳවීමේ කොන්දේසි - 05-10

**03.** ලංසු ඉදිරිපත් කිරීමේ අයදුම්පත - 11-12



සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත,මට්ටක්කුලියකොළඹ-15
0112-521 000/0112-529 717

2025.11.25

ධීවර , ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15

# නාරා-නිට්ටඹුව ප්‍රවාහන සේවා ලබා ගැනීම සඳහා ලංසු කැඳවීම - 2026.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ (නාරා)කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලය විසින් මාසිකව ගෙවීමේ පදනම මත නාරා-නිට්ටඹුව ප්‍රවාහන සේවාව සඳහා කුළී වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරන ලෙසට මෙයින් ආරාධනා කරමි.

01. අදාළ වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය ලබා ගත හැක්කේ ආපසු නොගෙවන රු:1,000.00 ක මුදලක් අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින්,නාරා සරප් වෙත ගෙවීමෙන් පසුව මිලදී ගැනුම් හා සැපයුම් ඒකකය වෙතිනි. සේවා කොන්ත්‍රාත් කාලය එක් වසරක් වේ.

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගයක දුර කි.මී | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | අවශ්‍ය ආසන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| නිට්ටඹුව - නාරා | නිට්ටඹුව බස් නැවතුම අසල සිට නුවර පාර,මීරිස්වත්ත හන්දිය ,නුවර පාර ඔස්සේ කඩවත , කිරිබත්ගොඩ , කැළණිය , පැලියගොඩ,කොටලගා, අළුත්මාවත හරහා නාරා ප්‍රධාන කාර්යාලය සහ ආපසු එම මාර්ගයේම නිට්ටඹුව බස් නැවතුම දක්වා. | කි.මී 38 | පෙ.ව 06.40 ට නිට්ටඹුව බස් නැවතුම අසල සිට | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 48 |

02. ලංසුවේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට දින 90 ක් එනම් , 2026.03.08 තෙක් විය යුතුය.

03. ලංසුව ඉදිරිපත් කිරීමේදී පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් හෝ අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින් නාරා සරප් වෙත මුදල් ගෙවා එහි මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.ලංසු සුරක්ෂණයේ වලංගු කාලය දින 119 ක් ,එනම් 2026.04.06 දක්වා වේ.

04. ලංසුව ඉදිරිපත් කිරීමේදී ආකෘතියේ කපා හෝ මකා හෝ වෙනයම් ආකාරයකින් හෝ වෙනසක් සිදු කරන්නේ නම් එම ස්ථානයන් හි ස්වකීය කෙටි අත්සන හා මුද්‍රාව යොදා එම වෙනස් කිරීම සහතික කළ යුතු අතර,එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසු ලේඛණ නිකුත් කරනු ලබන්නේ 2025.11.25 සිට 2025.12.08 වන දින දක්වා පමණි.මේ සම්බන්ධ පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2025.12.03 දින පෙ.ව 10.00 ට නාරා ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

06. මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2025.12.09 වන දින ප.ව 01.00 ට පෙර ''සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15 යන ලිපිනයට ,ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-01 ට බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.

ලංසු බහාලන කවරය මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර,එම කවරයේ වම්පස ඉහළ කෙළවර “නාරා -නිට්ටඹුව කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සඳහා මිළ ගණන් කැඳවීම-2026/ටෙන්ඩර් පෙට්ටි අංක- 01” යනුවෙන් සඳහන් කළ යුතුය.

07. 2025.12.09 දින ප.ව 01.00 ට ඉදිරිපත් වී ඇති ලංසු එදින එම වේලාවට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ (නාරා) මුදල් අංශයේදී විවෘත කරනු ලබන අතර ,එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකුට සහභාගී විය හැකිය.

08. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ,(අවශ්‍ය කෙරෙන වාහන වල විස්තර ,ගමන් මාර්ග හා අනෙකුත් පිරිවිතරයන්) www.nara.ac.lk නාරා වෙබ් අඩවිය මගින් හා 0112-521000/0112-529717,මිලදී ගැනුම් හා සැපයුම් නිළධාරී/නාරා මගින් ලබා ගත හැකිය.

ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය
කොළඹ-15
0112-529717/0112-521000

දිනය-2025.11.25

**<u>ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය</u>**

**<u>මාසිකව ගෙවීමේ පදනම මත නාරා කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සඳහා කුලී වාහන ලබා ගැනීම.</u>**

**<u>ලංසු කැඳවීමේ කොන්දේසි</u>**

<u>යොමුව- නාරා/පාලන/2025/65/RL/ටෙන්ඩර් අංක32</u>

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ **කළුතර-නාරා** කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සඳහා මෙයින් ලංසු කැඳවනු ලැබේ.

ලංසු කැඳවීමේ කොන්දේසි මෙසේය. අදාල වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛනය මෙහි දක්වා ඇත .

**01 . අවශ්‍ය කරන වාහන පංති,ගමන් මාර්ග හා අවශ්‍ය අනෙකුත් පිරිවිතරයන් පහත පරිදි වේ. කොන්ත්‍රාත් කාලය වසර එකක් වේ.**

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගයක දුර කි.මී | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | අවශ්‍ය ආසන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| නිට්ටඹුව - නාරා | **නිට්ටඹුව බස් නැවතුම අසල සිට නුවර පාර,මිරිස්වත්ත හන්දිය ,නුවර පාර ඔස්සේ කඩවත , කිරිබත්ගොඩ , කැළණිය , පෑලියගොඩ,තොටලග, අළුත්මාවත හරහා නාරා ප්‍රධාන කාර්යාලය සහ ආපසු එම මාර්ගයේම නිට්ටඹුව බස් නැවතුම දක්වා.** | **කි.මී 38** | **පෙ.ව 06.40 ට නිට්ටඹුව බස් නැවතුම අසල සිට** | **ප.ව 04.20 ට කොළඹ-15 මට්ටක්කුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන්** | **48** |

**02. ලංසු ඉදිරිපත් කිරීම :-**

**මෙයට අමුණා ඇති ලංසු ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කල යුතු වේ. මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2025.12.09 වන දින ප.ව 01.00 ට පෙර ''සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂන සහ සංවර්ධන නියෝජිතායතනය ,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15 යන ලිපිනයට ,ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-01 ට බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.**

**ලංසුවේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට වැඩකරන දින 90 ක් එනම්, 2026.03.08 තෙක් විය යුතුය.**

**ලංසු ඉදිරිපත් කිරීමේදී එක් ප්‍රවාහන සේවාවක් සඳහා පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් හෝ අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින්,නාරා සරප් වෙත මුදල් ගෙවා එහි මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය අවලංගු කල නොහැකි සහ නාරා ආයතනයෙන් කරනු ලබන පළමු ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කල හැකි විය යුතුය.සුරක්ෂණයේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට වැඩ කරන දින දින 119 ක් ,එනම් 2026.04.06 දින තෙක් විය යුතුය.**

**03. ලංසු පිළිබඳ විස්තර:-**

මෙම ලංසු කැඳවීමේ කොන්දේසි කියවා තේරුම් කර ගත් ලංසුකරුවන් /ලංසුකරුවා විසින් මේ සමග ඇති ලංසු ආකෘතිය සම්පූර්ණ කොට. එමගින් ලංසුව ඉදිරිපත් කල යුතුය.එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ඇත.

**04. වාහන පරීක්ෂා කිරීම:-**

වාහන පරීක්ෂා කර බැලීම සඳහා දක්වා ඇති ලිපිනයෙහි පිහිටි නාරා ප්‍රධාන කාර්යාලයට දන්වන ලද දිනයේදී හා නියමිත වේලාවේදී වාහන ඉදිරිපත් කල යුතුය.

**05. .ලංසු භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය:-**

අවම මිල සහිත ලංසුව පිළිගැනීමට ප්‍රසම්පාදක මණ්ඩලය බැඳී නැත. එසේම ඉදිරිපත් වී ඇති ලංසු සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම හෝ ඉන් කොටසක් භාර ගැනීම සඳහා බලය ප්‍රසම්පාදක මණ්ඩලයට ඇත. අනුමත වූ ලංසු හෝ ලංසුව පිළිබඳ අදාළ ලංසුකරුට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබේ.

**06. කාර්ය සාධන බැඳුම්කරය:-**

තෝරගත් ලංසුකරුට ඒ බව ලිඛිතව දැනුම් දීමෙන් දින 14 ක් ඇතුලත සේවා කොන්ත්‍රාත්තුව සඳහා කාර්යසාධන බැඳුම්කරයක් ඉදිරිපත් කල යුතුය. මෙම බැඳුම්කරයේ වටිනාකම ලංසුකරුගේ වාර්ශික සේවා ගාස්තුවෙන් 10% ලෙස ගණනය කරනු ලැබේ. මෙම බැඳුම්කරයේ වලංගු කාලය ලින් මාස 12 ක් වියයුතු වේ. එය පිළිගත් වාණිජ බැංකුවක් නිකුත් කල හෝ රක්ෂණ බැඳුම්කරයක් හා නාරා ආයතනයේ පළමු ලිඛිත ඉල්ලීම මත ගෙවන බවට සහතිකයකින් සමන්විත විය යුතුය. නැතහොත් අදාල මුදල නාරා ආයතනයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත වලංගු මුදලින් තැන්පත් කර හෝ බැංකු අණකරයක් මගින් ඉදිරිපත් කළ යුතුය.

මෙම බැඳුම්කරය කොන්ත්‍රාත්තුව සාර්ථකව අවසන් කල දිනයේ සිට දින 30 ක් ඇතුලත නිදහස් කරනු ලැබේ. කොන්ත්‍රාත්තුව බලපැවැත්වෙන කාලය තුලදී මෙම සේවාව සැපයීමේ යම් අඩුපාඩුවක් සිදු වුවහොත් කාර්යසාධන බැඳුම්කරය නිදහස් කරනු නොලැබේ.

තෝරගත් අයදුම්කරුවන් වෙත කෙරෙන ලිඛිත දැනුම් දීමෙන් පසු දින 21 ක් ඇතුළදී අනෙකුත් කොන්දේසි සම්පූර්ණ කරමින් අදාල වාහනය නාරා ආයතනයේ සේවය සඳහා ලබා දිය යුතුවේ.

**07. ගෙවීමේ ක්‍රමය:-**

ගෙවීම් කරනුයේ අදාල ලංසුකරු විසින් අත්සන් කර ඉදිරිපත් කරන බිල්පත් වලට පමණකි. එහිදී නාරා ආයතනයේ කාර්යමණ්ඩල සේවා භාර නිලධාරියාගේ සහතිකය ගෙවීම සඳහා අවශ්‍ය වේ. ඉල්ලුම් කරන සම්පූර්ණ මුදල, සේවා සපයන ලද දින ගණන, මාසිකව ගමන් ගත් දුර හා වාහනයේ අංකය එම බිල්පතේ පැහැදිලිව හා නිවරැදිව සඳහන් කළ යුතුය. ඩීසල් මිලේ ඉහළ පහළ යාම් අනුව පහත සඳහන් පරිදි ගෙවීම් සංශෝධනය කරනු ලැබේ.

**සැ.යු- හදිසි ව්‍යවසන තත්වයක් රට තුළ ඇති වුවහොත් අදාළ කාල සීමාවට අදාළව ගෙවීම් සිදු කිරීමට නාරා ආයතනය විසින් කටයුතු කරනු නොලැබේ.**

| |
|---|
| <u>ඩීසල් ලීටරයක මිල x මාසිකව සත්‍ය ලෙස ධාවනය කළ කිලෝමීටර ගණන</u><br>ඉන්ධන ලීටරයකින් ධාවනය කළ හැකි කිලෝමීටර ගණන |

**(අංක 01 හි සඳහන් කළ දුර ප්‍රමාණය මත පදනම්ව)**

මෙහිදී ඉන්ධන ලීටරයකින් ධාවනය කළ හැකි කිලෝමීටර් ගණන ගණනය කරනුයේ අදාල වාහනය සම්බන්ධයෙන් නාරා ආයතනයේ බලයලත් නිලධාරි විසින් පරීක්ෂණ ධාවනයකින් පසුව නියම කරන අගය වේ. මාසයක් තුළ ඩීසල් මිලේ වෙනස්වීම් කිහිපවතාවක් සිදුවුවහොත් වෙනස්වන කාල සීමාව අනුව ධාවනය කර ඇති දුර සලකා බලා, ඒ අනුව ගණනය කිරීම් සිදු කොට ගෙවීම් කරනු ලැබේ.

එක් මසක් තුළ නියම කරනු ලබන ඕනෑම දිනයකදී / දිනයන්හි දී වාහනය සැපයීමට සැපයුම්කරු එකඟ විය යුතුය.

ධාවනය කරනු ලබන දුර ගණනය කරනු ලබන්නේ ගමනේ ආරම්භක ස්ථානය ,මෙහි අමුණා ඇති ලංසු ආරාධනා පත්‍රයේ 01 හි දක්වා ඇති ලෙසට හා අවසාන ස්ථානය නාරා ආයතනය ලෙස සලකමින් හා දක්වා ඇති මාර්ගයේ ගමන් ගනිමින් නාරා ආයතනයේ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා කරන ධාවනයන් සඳහාය.

එකතු කිරීමේ අගය මත පනවන බද්ද (VAT) ගෙවනු ලබන්නේ ,එම බදු සඳහා ලියාපදිංචි අංකයක් ඇති හා ලංසු ආකෘතියේ ඒ බව සඳහන් කළ සැපයුම්කරුවන්ට පමණි.

**08. .ගෙවීම් කරන ආකාරය:-**

සැපයුම්කරු විසින් ඉහත වගන්තියේ සඳහන් කළ පරිදි මාසික බිල්පත ඉදිරිපත් කළ යුතුය. ඉහත වගන්තියේ අවශ්‍යතා සම්පූර්ණ කරමින් නාරා ආයතනය විසින් දින 21 ක් ඇතුළත ගෙවීම් සිදු කරනු ඇත.

**09. සැපයුම්කරුගේ සේවාවන් පමාවීම:-**

පෙ.'ව 08.30 ට පෙර කාර්ය මණ්ඩලය ද සමග නාරා ප්‍රධාන කාර්යාලයට වාහනය පැමිණිය යුතු අතර. ප. ව: 04.20 ට කාර්ය මණ්ඩලය ද සමග නාරා ප්‍රධාන කාර්යාලයෙන් වාහනය පිටත් විය යුතුය. මෙම අවස්ථා දෙකේ සිදු වන ප්‍රමාද වීම් සඳහා පහත සඳහන් ආකාරයට ගෙවීම් ගාස්තුවෙන් අඩු කරනු ලැබේ.

01. එක් මසක් ඇතුළත සිදු කරන පළමු හා දෙවන ප්‍රමාද කිරීම් සඳහා අඩු කිරීම් නැත.
02. එක් මසක් ඇතුළත සිදු කරන තෙවන ප්‍රමාද කිරීමේ සිට.

| | | |
|---|---|---|
| i. | පළමු විනාඩි 15 තුළ සිදුවන ප්‍රමාදවීම් | -දෛනික ගාස්තුවෙන් 10% |
| ii. | ඊළග විනාඩි 15 තුළ සිදුවන ප්‍රමාදවීම් | -දෛනික ගාස්තුවෙන් 15% |
| iii. | .ඊළග විනාඩි 30 තුළ සිදුවන ප්‍රමාදවීම් | -දෛනික ගාස්තුවෙන් 20% |
| iv. | ඊළග විනාඩි 30 තුළ සිදුවන ප්‍රමාදවීම් | -දෛනික ගාස්තුවෙන් 25% |
| v. | ඉන්පසුව වන ප්‍රමාදවීම් සඳහා | -දෛනික ගාස්තුවෙන් 40% |

මීට අමතරව නියම කරන ලද වේලාවට වාහනය එවීමට සැපයුම්කරු දිගින් දිගටම අසමත් වන්නේ නම්, ඉහත දක්වන ලද ප්‍රමාද ගාස්තු නොතකා හරිමින් සේවා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ බලයද නාරා ආයතනය සතු වේ. එම බලය නිර්වචනය කිරීමේ පරම අයිතිය නාරා ආයතනය සතුවේ. එහිදී කාර්යසාධන බැදුම්කරයද නාරා ආයතනය සන්තක වේ.

ඉහත දක්වන ලද ඕනෑම ගාස්තුවක් බැදුම්කරය මගින් හෝ මාසික ගාස්තුව මගින් හෝ අයකර ගැනීමේ බලය නාරා ආයතනය සතුය. මෙහිදී එන පළමු වැනි ගෙවීම මත මෙම අයකිරීම සිදු කරනු ලබයි.

කෙසේ වෙතත් පවතින වාතාවරණය යටතේ ප්‍රවාහන සේවා සපයන පාර්ශවයේ පරිපාලනයෙන් තොර පරිබාහිර කාරණයක් හේතුකොට ගෙන හදිසියේ යම් ප්‍රමාදයක් සිදු වූ විට එය පිළිබඳව සලකා බැලීම සඳහා නාරා ආයතන කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා භාර නිලධාරි ට ලිඛිතව ඉල්ලීමක් සිදු කළ යුතු අතර. ඒ පිළිබඳව සලකා බලනු ඇත.

දැඩි වර්ෂාව නිසා වන මාර්ග තදබදය (ගංවතුර ඇති වූ අවස්ථාවක හැර) සාමාන්‍ය වාහන තදබදය වැනි කරුණු හේතු කොට ගෙන ප්‍රමාද වීම් සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

පාලම්. පාරවල් උමං මාර්ගවැනි ඉදිකිරීම් හේතු මත සැලකිය යුතු දින ගණනක් ප්‍රමාද වීම් සිදු විය හැකි බවට පූර්ව නිගමනයක් කල හැකි අවස්ථා වලදී සිදුවිය හැකි ප්‍රමාදවීම් අවම කර ගැනීම සඳහා විකල්ප මාර්ග භාවිතා කිරීම හෝ ආරම්භක වේලාව වෙනස් කිරීම හෝ වැනි උපක්‍රමික වෙනස් කිරීමක් කිරීමට නාරා ආයතනයේ කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා භාර නිලධාරි ට බලය පවරා තිබේ.

**10. සැපයුම්කරුගේ සේවා ලබා නොදීම:-**

පූර්ව දැනුම් දීමක් නොමැතිව හෝ කල්තබා විකල්ප සැළසීමකින් තොරව නියමිත දිනෙක සේවා සැපයීමට අපොහොසත් වන අවස්ථාවන්හි දී පහත අන්දමට දඩ මුදලක් නොවන හානිපූරණ වන්දියක් අයකරනු ඇත.

i. එක් ගමන් වාරයක් සඳහා :-

මාසික ගාස්තුවෙන් විස්සෙන් එකක(1/20)මුදල හා ඊට 10% දඩ මුදලක් නොවන හානිපූරණ වන්දියක් නාරා ආයතනය විසින් විකල්පයක් සළසා ගැනීම සඳහා වැය කල මුදල හා ඊට 10% දඩ මුදලක් නොවන හානිපූරණ වන්දියක් හෝ යන දෙකෙහි වැඩි මුදල අය කරනු ඇත.

ii. ඉහත දක්වක ඕනෑම ගාස්තුවක් බැඳුම්කරය මගින් හෝ මාසික ගාස්තුව මගින් හෝ අයකර ගැනීමේ බලය නාරා ආයතනය සතුයග.මෙහිදි පළමු වැනි ගෙවීම මත මෙම අයකිරීම් සිදු කරනු ලබයි.

**11. වාහනය කුලියට ගැනීම් කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි:-**

i. වාහනය මනා ධාවනය තත්වයකින් යුක්ත විය යුතුය. සෑම වාහනයක්ම ක්‍රියාත්මක තත්වයේ පවතින AM/FM චැනල් සහිත ගුවන් විදුලි යන්ත්‍රයක් තිබිය යුතුය.

ii. සැපයීමට බලාපොරොත්තු වන වාහන කාණ්ඩය සඳහා ලංසු ආරාධනා නිවේදනය සඳහන් අන්දමට නියමිත ආසන සංඛ්‍යාවක් හා තිබිය යුතුය

iii. ලංසු විවෘත කරන දිනට නිෂ්පාදිත වර්ෂයෙන් අවුරුදු 05ක් නොයික්මවන වාහන සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. ඉදිරිපත් කරන වාහනය හොඳ ධාවන තත්වයේ තිබිය යුතුය.

iv. ලංසු විවෘත කරන දිනට වලංගු ආදායම් බලපත්‍රය හා රක්ෂණය සහතිකය, සහතික කළ ජායා පිටපත් ලංසු ආකෘති පත්‍රය සමග අමුණා එවිය යුතුය. එසේ නොඑවනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

v. සාර්ථක ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර පූර්ණ රක්ෂණයක්ද, කුළී වාහනයක් වශයෙන් යෙදවීම සඳහා රක්ෂණයද, රක්ෂණයෙන් ආවරණය විය යුතුය. වාහනයෙ හි පූර්ණ අයිතිය ලංසුකරු වෙත නොමැති නම් කොන්ත්‍රාත් කාලය ආවරණය වන පරිදි අදාල වාහනය කුලියට දීම සඳහා ලංසුකරුට පූරණ බලය පවරන වලංගු ලිපියක් ලංසු ආකෘතිය සමග ඉදිරිපත් කළ යුතුය.

vi. වාහනයේ රියදුරුට මගී වාහන පැදීම සඳහා නීත්‍යානුකූලව අවසර ලැබී ඇති රිය පැදවීමේ බලපත්‍රයක් තිබිය යුතුය. වාහන භාවිත කරන නිලධාරියා රියදුරාගේ රිය පැදවීම ල නියමිත වේලාවට රාජකාරියට වාර්තා කිරීම ල ආචාරශීලීත්වය .ලච්නය ල හැසිරීම, අධිවේගී හා නොසැලකිමත් ධාවනය, වාහනයේ පිරිසිදු කම, ආදිය පිළිබඳ සැලකීමත් වන  අතර, මෙම දුර්වලතාවයන් අතරින් එකක් පිළිබඳව හෝ පළමු වතාවට රියදුරුට අවවාද කිරීමෙන් අනතුරුව තවදුරටත් එම රියදුරු ඉහත කී කරුණු පිළිබඳව නොසැලකිමත් වේ නම්, ලංසුකරුගේ බැදුම්කරය නාරා   ආයතනයට පවරා ගැනීමට යටත්ව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ බලය නාරා ආයතනය සතු වේ.

මේ අනුව රියදුරු වාහනය ධාවනයට නොසුදුසු යැයි වාහනය පාවිච්චි කරන නිලධාරින්ට හැඟීයානම් වහාම වෙනත් සුදුසු රියදුරෙකු යෙදවීම කොන්ත්‍රාත්කරුගේ බැදීමකි. එසේම වාහනයේ අලුත්වැඩියා පිළිබඳව දැනුම් දී එම අවශ්‍යතාවය දින 03 ක් තුළ ඉටු කිරීමද කොන්ත්‍රාත්කරුගේ බැදීමකි. වෙනත් රියදුරෙකු යොදවන අවස්ථාවකදී නව රියදුරාගේ රිය පැදවීමේ බලපත්‍රය වාහනය භාවිතා කරන නිලධාරින් ගේ අධීක්ෂණය සඳහා අවශ්‍ය ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කල යුතුය.

vii. ඉන්ධන වියදම්,නඩත්තු, වාරික සේවා, අලුත්වැඩියා සේවා, රියදුරාගේ වේතනය ,ගමන් වියදම්, ඉදුම් හිටුම් රක්ෂණ බලපත්‍ර ගාස්තු, ආදිය ඕනෑම වියදමක් සැපයුම්කරු විසින් දැරිය යුතුයි.

viii. වාහනය අනතුරට ලක් වීම හෝ වෙනත් ආපදාවකදී හෝ  වන හානි සඳහා අලාභය හානිපූර්ණය සඳහා හෝ වෙනයම් ගෙවීමක් සඳහා හෝ නාරා ආයතනය බැදී නොමැත.

ix. වාහනය අනතුරට ලක් වීම නිසා හෝ වෙනත් ආපදාවක් නිසා හෝ නැතහොත් වෙනත් හේතුවක් නිසා හෝ රාජකාරියට යෙදවීම නොහැකිනම්,  ඒ බව අවම වශයෙන් වැඩ කරන දින 02 කට කලින් නාරා කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා භාර නිලධාරියාට ලිඛිතව දන්වා, එම තත්වයේම වෙනත් වාහනයක් කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය. එසේ නොවෙන අවස්ථා වලදී කාර්යසාධන බැදුම්කරය නිදහස් නොකිරීමේ කටයුතු යෙදීමේ බලය නාරා ආයතනය සතුය.

x. වාහනයේ කොන්ත්‍රාත් කාල සීමාව කල් පිරිමට පෙර අවසන් කිරීමට හෝ තවත් දීර්ඝ කිරීමට නාරා ආයතනය තීරණයෙ කළහොත් ,ඒ පිළිබඳ දින 14 ක පූර්ව දැනුම් දීමක් කරනු ඇත.

**xi**. සාර්ථක ලංසුකරු නාරා ආයතනය සමග මෙම සේවා සැපයීම සම්බන්ධව ඉහත සඳහන් කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹිය යුතුය.

**xii**. මෙම සේවා කොන්ත්‍රාත්තුව වෙනත් අයකුට පැවරීමට හෝ උපකොන්ත්‍රාත් ලබා දීම හෝ සිදුකල නොහැක

**xiii..ප්‍රවාහන සේවා වාහන ගාල් කිරීමේ පහසුකම් නාරා ආයතනය විසින් සපයනු නොලැබේ.**

## ලංසු ඇගයීමේ පටිපාටිය

ලංසු ඇගයීමේදී පහත සඳහන් කරුණු සැළකිල්ලට ගනු ඇත.

i. ලංසු ඇගයීමේ පටිපාටිය ලෙස දෙදනිකව අදාළ ගමන් මාර්ගයේම ගමන් කරමින් නාරා කාර්ය මණ්ඩළය ප්‍රවාහනය කිරීම සඳහා වැය කළ යුතු ඩීසල් ලීටර් ගණන.

ii. ඒ සඳහා වන මුදල් හැර දෛනිකව ගාස්තුව.

iii. වාහන තත්වය හා බලපත්‍ර (වාහනයේ භෞතික තත්වය,අදාළ බලපත්‍ර හා සහතික වාහනය පරීක්ෂා කරන අවස්ථාවේදී පරීක්ෂා කරනු ලැබේ.ඇගයීම් ආකෘතිය අමුණා ඇත)

iv. සැපයුම්කරුගේ පළපුරුද්ද .(සේවා සහතික ලංසුව සමග අමුණා එවිය යුතුය)

වැදගත්-දෛනික ගාස්තුව පිළිබඳව සළකා බලන්නේ ජාතික ප්‍රවාහන කොමිසමේ නිර්දේශයන්ට යටත්වය.

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය**

**කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සදහා මාසික කුළී පදනම මත වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කිරිම.**

| ලංසු ඉදිරිපත් කිරිමේ ලේඛණය | | | |
|---|---|---|---|
| 01 | ලංසුකරුගේ සම්පූර්ණ නම | | |
| 02 | ලංසුකරුගේ ලිපිනය | | |
| 03 | ලංසුකරුගේ දුරකථන හා ෆැක්ස් අංක | | |
| 04 | ලංසුව ඉදිරිපත් කරන මාර්ගය | | |
| 05 | ඉදිරිපත් කරන වාහනයේ අංකය/අංක හා ලියාපදිංචි වර්ෂය (විස්තර ලියා අමුණන්න) | වාහන අංකය | ලි.ප වර්ෂය |
| | | | |
| 06 | ඉදිරිපත් කරන වාහනයේ වර්ගය හා නිෂ්පාදික වර්ෂය (ලියාපදිංචි සහතිකවල පිටපත් අමුණන්න) | වාහනයේ වර්ගය | නිෂ්පාදික වර්ෂය |
| | | | |
| 07 | ඉදිරිපත් කරන වාහනයේ අයිතිකරු ලංසුකරු නොවේ නම් ,අයිතිකරුගේ නම හා ලිපිනය | නම | ලිපිනය |
| | | | |
| 08 | ඉදිරිපත් කරන වාහනයේ ආපදාවකදී සැපයීමට අමතර වාහන තිබේද | | |
| 09 | එම වාහනයේ/වාහන වල අංක | | |
| 10 | වැට් සදහා ලියාපදිංචි වී තිබේනම් එහි අංකය | | |
| 11 | ඉදිරිපත් කරන වාහනයේ ඩීසල් ලීටරයකින් ධාවනය කළ හැකි කිලෝමීටර ගණන (විස්තර ලියා අමුණන්න) | | |
| 12 | වාහනයට සම්බන්ධ පහසුකම් හා උපාංග පිළිබද විස්තර(වායු සමීකරණ,ස්වංක්‍රිය දොර,සීඩී ප්ලේයර්,රූපවාහිනි යන්ත්‍ර ආදීය) | | |
| 13 | ලංසු ඉදිරිපත් කරන ප්‍රවාහන සේවාවට අදාළව ගමන් මාර්ගයේ ගමන් කරමින් නාරා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරිම සදහා එක් දිනකට වැය කළ යුතු | | |

| | | |
|---|---|---|
| | ඩීසල් ලීටර ගණන: | |
| 14 | ඩීසල් වියදම හා වැට් හැර දෛනික ගාස්තුව | |
| 15 | වැට් (VAT)ගෙවන්නේ නම් එම මුදල | |
| 16 | ඩීසල් වියදම හා වැට් හැර වැඩ කරන දින 20 ක මාසයක් සඳහා මාසික ගාස්තුව | |

අදාළ ප්‍රවාහන සේවය සඳහා මා විසින් ඉදිරිපත් කරන ලංසුව නාරා ආයතනය විසින් පිළිගතහොත් ලංසු කැඳවීම් නිවේදනයේ පරිදි කාර්යසාධන බැඳුම්කරය තැන්පත් කිරීමට එකග වෙමි.ලංසුවේ වලංගු කාලය 2026..................දක්වා වේ.

ඉහතින් මා සදහන් කළ සියළුම විස්තර නිවරැදි බවටත් ,මා මෙම ලංසු කැදවීමේ නිවේදනයේ සදහන් කොන්දේසිවලට එකග වන බවත් ,මාගේ වාහන මෙම ලංසු ආකෘතියේ සදහන් මිළට යටත්ව කුළියට ලබා දීමට එකග වන බවත් මෙයින් සහතික කරමි.

ලංසුකරුගේ අත්සන :-

මුද්‍රාව :-

දිනය :-